Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# රිදීගම ප්‍රාදේශීය සභාව

රිදීගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුස්සන් තෝරා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති රිදීගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

වයඹ ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 වැනි දින හා 2009.05.12 වැනි දින අනුමත කරන ලද වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය, ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයට අයත් බඳවා ගැනීම් පටිපාටිය අනුව අදාළ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

| *තනතුරු නාමය හා ශ්‍රේණිය* | *පුරප්පාඩු ගණන* | *සේවක ගණය හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 01. ආදාහනාගාර ක්‍රියාකරු III | 01 | ප්‍රාථමික අර්ධ ශිල්පීය PL2-2016 රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450.00 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>අධ්‍යායන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයන් හැර)<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br>• දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණියේ (9 වසර) සමත් විය යුතු ය.<br>• අනියම් /ආදේශක / කොන්ත්‍රාත් පදනමින් ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. | පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ යටත් පිරිසෙයින් වසර 02කට වැඩි කාලයක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ.) |

| තනතුරු නාමය හා ශ්‍රේණිය | පුරප්පාඩු ගණන | සේවක ගණය හා වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|---|
| 02.ආදාහනාගාර සහායක III | 01 | ප්‍රාථමික ශිල්පීය නොවන PL1-2016 රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00 | • අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත්වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයන් හැර)<br>• අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. | |
| 03.කාර්යාල කාර්ය සහායක III | 01 | | | |
| 04.වැඩ/ ක්ෂේත්‍ර කම්කරු III | 04 | ප්‍රාථමික ශිල්පීය නොවන PL1-2016 රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00 | • රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතු ය.<br>• අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. | |

01. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර/ අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් පදනමින් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

iii. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

iv. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 3ක් රිදීගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (පදිංචිය, වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතු ය.)

v. දැනටමත් රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ඔහු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 05ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

ii. වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

iii. රජයේ ප්‍රතිපත්තිවලට ද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, වයඹ පළාත් සභාව විසින් වරින් වර පනවනු ලබන නීති රීති හා නියෝගවලට ද ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ උපදෙස්, දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතු ය.

iv. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. අවුරුදු 03ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

v. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

03. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

i. මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය 2019 අප්‍රේල් මස 25 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ලේකම්,
රිදීගම ප්‍රාදේශීය සභාව,
රිදීගම.

ii. අයදුම්පත් බහාලන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ *අයදුම්කරනු ලබන තනතුරු නාමය* සඳහන් කළ යුතු ය.

iii. අසම්පූර්ණ සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iv. දැනටමත් රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම් පත්‍රය සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.

v. අයදුම් පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික;
*(ඇ)* පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද);
*(ඈ)* මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්;
*(ඉ)* වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අසම්පූර්ණ අයදුම් පත හා අංක 03V හි සඳහන් තොරතුරු ඉදිරිපත් කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම් පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ජේ. ඒ. අජිත් කුමාරසිංහ,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
රිදීගම.

2019 වර්ෂයේ මාර්තු මස 25 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය සභාව,
රිදීගම.

ආදර්ශ අයදුම් පත්‍රය

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ රිදීගම ප්‍රාදේශීය සභාවේ**
**පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම - 2019**

**................................................................................................ *තනතුර සඳහා අයදුම් පත්‍රය***

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :—————————————— .

(ii) මුලකුරු සමග නම :—————————————— .

02. ජාතික හැඳුනුම්පත් අංකය:—————————————— .

03. ස්ථිර ලිපිනය:—————————————— .

04. ග්‍රාම නිලධාරි වසම :—————————————— .

05. උපන් දිනය : අවුරුද්ද :—————— මාසය :—————— . දිනය:——————

06. වයස : අවුරුදු :——————. මාස :——————. දින:—————— .

07. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————————.

08. විවාහක/ අවිවාහක බව :——————————— .

09. දුරකතන අංකය :——————————— .

10. රිදීගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය වසර : :——————————— .

11. (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ද? :——————————— .

(ii) එසේ නම්, උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද? යන වග : :——————————— .

12. අධ්‍යාපන සුදුසුකම් :——————————— .

13. වෘත්තීය සුදුසුකම් :——————————— .

14. වෙනත් සුදුසුකම් :——————————— .

15. සේවා පළපුරුද්ද :——————————— .

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සපයා ඇති තොරතුරු අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

දිනය :.........................

.........................
අයදුම්කරුගේ අත්සන

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ......................................................... මයා/මිය/ මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ............. ..................................................... වශයෙන් සේවය කරයි.

ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත්, පූර්වාසන්න වසර 5 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත් මින් සහතික කරන අතර, පත්වීමක් ලැබීමකට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

.........................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ
බලයලත් නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

දිනය :——————————— .

නම:——————————— .

පදවි නාමය:——————————— .

ආයතන ලිපිනය:——————————— .